www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION-SOUTHERN PROVINCE

අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)

09 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව | කාලය පැය 02යි

නම/ විභාග අංකය :- ................................................................................................................................

## I කොටස

❖ සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට හිස්තැනට ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.

(1) ලෝක ජන සංඛ්‍යාවෙන් ....................................................(60% , 70% , 80%) ක් පමණ ආසියානු ප්‍රදේශයේ වාසය කරයි.

(2) වාර්ෂිකව ශාකවල පත්‍ර හැලීම .............................................. (නිවර්තන, සෞම්‍ය, ශීත) කලාපීය වනාන්තර වල සිදු වේ.

(3) ලෝකයේ විශාලතම වාරිමාර්ග පද්ධතියක් ........................................... (පාකිස්ථානය, ඉන්දියාව, ඩුබායි) තුළ දක්නට ලැබේ.

(4) සේවා මධ්‍යස්ථානයක් ලෙසට .............................................. (සිංගප්පූරුව, ඩුබායි, පාකිස්ථානය) වැදගත් වේ.

(5) ශ්‍රී ලංකාවේ 1:50,000 සිතියම් සකස් කරනු ලබන්නේ ............................................. (අධ්‍යාපන, මිනින්දෝරු, ඉඩම් සංවර්ධන) දෙපාර්තමේන්තුව මගිනි.

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට අදාල ප්‍රකාශන කියවා බලා නිවැරදි නම් ''නි'' යන්න වටා ද වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.

(6) යාපනය දිස්ත්‍රික්කයේ ශ්‍රී ලංකාවේ වැඩිම ජන ඝනත්වයක් පවතී. නි / වැ

(7) ආසියා මහාද්වීපය නැගෙනහිර දේශාංශ 25 ත් 180 ත් අතර පිහිටා ඇත. නි / වැ

(8) දීර්ඝ කාලීනව ඛාදනයට ලක්ව ඉතිරි වී ඇති පාෂාණ කුට්ටි මගින් ගිණි කඳු නිර්මාණය කරයි. නි / වැ

(9) අවුරුද්දේ මැයි සිට සැප්තැම්බර් දක්වා ලංකාවට නිරිතදිග මෝසම් වර්ෂාව ලැබේ. නි / වැ

(10) භෞතික භූ දර්ශනය හා මානුෂ භූ දර්ශනය අතර ඍජු සබඳතාවක් පවතී. නි / වැ

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු තිත් ඉර මත ලියන්න.

(11) ........................................... විල ලෝකයේ ඇති ගැඹුරුම මිරිදිය විල යි.

(12) ශ්‍රී ලංකාව ........................................... අර්ධගෝලයේ පිහිටි රට කි.

(13) භූ විෂමතා කලාප අනුව ........................................... 30m සිට 300m දක්වා උස් වූ ප්‍රදේශයකි.



Agaram.lk - Keep your dreams alive!
Agaram.lk - Keep your dreams alive!
agaram.lk

(14) මොහෙන්ජදාරෝ නගරය ................................................ ශිෂ්ටාචාරයට අයත් වේ.

(15) ශ්‍රී ලංකාවේ කර්මාන්ත බහුල වශයෙන් .......................................... පළාත තුළ ඒකරාශී වී ඇත.

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(16) හෝර්ටන් තැන්න, සීතාඑළිය, සඳතැන්න වැනි ප්‍රදේශ ආශ්‍රිතව ව්‍යාප්ත වී ඇති වනාන්තර වර්ගය වන්නේ,

(1) අතරමැදි සදාහරිත වනාන්තර (2) කටු පඳුරු හා ලඳු කැලෑ
(3) කඳුකර වියළි කලාපීය වනාන්තර (4) පහතරට තෙත් කලාපීය වනාන්තර

(17) උස් බිමක පිහිටි සමතලා භූමි ප්‍රදේශය

(1) හෙල්වැටි (2) කඳුකරය
(3) සානුව (4) තැනිතලාව

(18) ග්‍රාමීය මෙන්ම නාගරික ලක්ෂණ මිශ්‍ර වී ඇති ජනාවාස හඳුන්වන්නේ,

(1) ග්‍රාමීය ජනාවාස (2) නාගරික ජනාවාස
(3) ගොවි ජනාවාස (4) ගැමි නාගරික ජනාවාස

(19) ශ්‍රී ලංකාවේ ගංගා අතරින් ඍතුමය ගංගාවක් **නොවන්නේ**,

(1) මල්වතු ඔය (2) කුඹුක්කන් ඔය
(3) මැණික් ගඟ (4) කැලණි ගඟ

(20) පහත සූත්‍රයෙන් ගණනය කරනු ලබන සංවර්ධන දර්ශකය වන්නේ,

$$\frac{\text{වයස අවුරුදු 15 ට ඉහළ අකුරු ලිවීමට හා කියවීමට හැකි පුද්ගලයන් සංඛ්‍යාව}}{\text{වයස අවුරුදු 15 ට ඉහළ මුළු ජන සංඛ්‍යාව}} \times 100$$

(1) ළදරු මරණ අනුපාතය (2) ඒක ශීර්ෂ ආදායම
(3) සාක්ෂරතාව (4) අකුරු ලිවීමට බැරි අය

(ලකුණු 2x20=40)



agaram.lk
Agaram.lk - Keep your dreams alive!
Agaram.lk - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்

DEPARTMENT OF EDUCATION SOUTHERN PROVINCE


අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)

09 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව

## II කොටස

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. එහි අ, ආ, ඉ යන කොටස් වලට පිළිතුරු සපයන්න.


(01) (අ) ඔබට ලබා දී ඇති ආසියානු ප්‍රදේශ දක්වන සිතියමේ ලකුණු කර ඇති ස්ථාන හඳුනා ගෙන ඊට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ඔබේ පිළිතුරු පත්‍රයේ පිළිවෙළින් ලියන්න.




(i) පැසිපික් සාගරය
(ii) ජපන් දූපත්
(iii) ඉන්දු ගංගාව
(iv) සුමාත්‍රා දූපත්
(v) අරාබි මුහුද
(vi) හොවැංහෝ ගංගාව
(vii) ඩෙකෑන් සානුව
(viii) යූරල් කඳුවැටිය

(ලකුණු 1 x 8)

(ආ) ලබා දී ඇති ශ්‍රී ලංකා සිතියමේ සඳහන් අක්ෂරවලට ගැලපෙන ස්ථාන ඒවා ඉදිරියෙන් ලියන්න.




(I) සංගමන්කන්ද තුඩුව
(ii) කළු ගඟ
(iii) ත්‍රිකුණාමලය
(iv) මන්නාරම දූපත
(v) කල්පිටිය
(vi) ගල් ඔය
(vii) මාතර
(viii) පොලොන්නරුව දිස්ත්‍රික්කය

(ලකුණු 1 x 8)



Agaram.lk - Keep your dreams alive!
Agaram.lk - Keep your dreams alive!
agaram.lk


Agaram.lk - Keep your dreams alive!

(෧) කෙටි පිළිතුරු සපයන්න.

a) ලෝකයේ පියස්ස යන අන්වර්ථ නාමයෙන් හඳුන්වන්නේ කුමක් ද?
b) ඒරල් මුහුදට වැටෙන ගංගාවක් ලියන්න.
c) යුරෝපය හා ආසියාව එක්ව ගත් විට එය හඳුන්වන නම කුමක් ද?
d) ශ්‍රී ලංකාව සිතියම් ගත කිරීමට යොදා ගෙන ඇති 1:50,000 සිතියම් සංඛ්‍යාව කීය ද? (ලකුණු 1 x 4)

(02) (i) ආසියාවේ දක්නට ලැබෙන වඩාත් උස් කඳු ශිඛර දෙකක් නම් කරන්න. (ලකුණු 02)
(ii) ආසියා මහද්වීපය තුළ දක්නට ලැබෙන ප්‍රධාන දේශගුණික කලාප තුන නම් කරන්න. (ලකුණු 03)
(iii) ආසියා ප්‍රදේශයේ ඇති සුවිශේෂී ලක්ෂණ තුනක් නම්කර ඉන් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) භෞතික භූ දර්ශනය යනු කුමක් ද? (ලකුණු 02)
(ii) වෙරළබඩ තැනිතලාවේ දක්නට ලැබෙන භූ ලක්ෂණ කිහිපයක් රූපයේ දැක්වේ.




A, B හා C අක්ෂර මගින් දක්වන වෙරළ ලක්ෂණ නම් කරන්න. (ලකුණු 03)

(iii) a) මධ්‍යම කඳුකරයේ ඇති සානුවක් නම් කරන්න. (ලකුණු 01)
b) මධ්‍යම කඳුකරයේ ඇති කපොල්ලක් නම් කරන්න. (ලකුණු 01)
c) ශ්‍රී ලංකාවේ උෂ්ණත්ව ව්‍යාප්තිය කෙරෙහි බලපාන සාධක තුනක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 03)

(04) (I) කාලගුණය යනු කුමක් ද? (ලකුණු 02)
(ii) ශ්‍රී ලංකාවේ ස්වාභාවික වෘක්ෂලතා කලාප වර්ග කිරීමට පදනම් කර ගන්නා සාධක තුනක් ලියන්න. (ලකුණු 03)
(iii) a) ශ්‍රී ලංකාවේ පහතරට තෙත් කලාපීය වනාන්තර ව්‍යාප්තව ඇති ප්‍රදේශ දෙකක් නම් කරන්න. (ලකුණු 02)
b) පහතරට තෙත් කලාපීය වනාන්තර වල දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් නම් කර ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 03)

(05) (i) ලංකාවේ තෙත් කලාපීය භූ දර්ශනය හා වියළි කලාපීය භූ දර්ශනය වෙන් කරන ගංගා දෙක නම් කරන්න. (ලකුණු 02)
(ii) වියළි කලාපීය භූ දර්ශනයේ දැකිය හැකි ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)
(iii) a) කඳුකර භූ දර්ශනය තුළ කරනු ලබන මිනිස් ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ලකුණු 02)
b) කඳුකර භූ දර්ශනය තුළ දක්නට ලැබෙන පහත අනුවර්තන වලට හේතුව බැගින් ලියන්න.
1. කඳුකර ප්‍රදේශවල මාර්ග වංගු සහිත වීමට.
2. කඳුකර ප්‍රදේශවල ශාක උසින් අඩු වීමට.
3. කඳුකර ප්‍රදේශවල සංචාරක ආකර්ශණය වැඩි වීමට. (ලකුණු 03)

(06) (i) ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ අවකාශීය වෙනස්කම් දක්වන සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) සංවර්ධනය මැනීමට භාවිත කරන දර්ශක තුනක් නම් කරන්න. (ලකුණු 03)

(iii) සාක්ෂරතාවය වැඩිවීම හා අඩුවීම රටක සංවර්ධන මට්ටම කෙරෙහි බලපාන ආකාරය සඳහන් කරන්න. (ලකුණු 05)

(07) (i) තිරසර සංවර්ධනය යනු කුමක් ද? (ලකුණු 02)

(ii) පාරිසරික තුලිතතාව බිඳවැටීමෙන් ඇතිවන අහිතකර ප්‍රතිඵල තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) පාරිසරික තුලිතතාව බිඳවැටීමට බලපාන මානව ක්‍රියාකාරකම් තුනක් නම් කර ඉන් එකක් මඟින් සිදුවන බලපෑම් විස්තර කරන්න. (ලකුණු 05)

(08) (i) සමෝච්ඡ රේඛාවක් යනු කුමක් ද? (ලකුණු 02)

(ii) 1:50,000 භූ ලක්ෂණ සිතියමක් මඟින් දක්වනු ලබන භෞතික ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) a) 1:50,000 සිතියම් මගින් දක්වනු ලබන සංස්කෘතික ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

b) පහත සඳහන් ලක්ෂණ සම්මත වර්ණ මගින් දක්වන්න.

1. වී වගාව ☐

2. පාසල ☐

3. ප්‍රධාන මාර්ගය ☐

(සම්මත වර්ණ අනුව දැක්විය යුතුයි.) (ලකුණු 03)



Agaram.lk - Keep your dreams alive!
Agaram.lk - Keep your dreams alive!
agaram.lk
agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව / தென் மாகாணக் கல்வித் திணைக்களம்

DEPARTMENT OF EDUCATION SOUTHERN PROVINCE

අවසාන වාර පරීක්ෂණය - 2021 (2022 මාර්තු)

**09 ශ්‍රේණිය** | **භූගෝල විද්‍යාව**

නම/ විභාග අංකය :- ..........................................................................................................

## පිළිතුරු පත්‍රය I

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | 60% | (6) | වැ | (11) | බයිකල් | (16) | 3 |
| (2) | සෞම්‍ය | (7) | නි | (12) | උතුරු | (17) | 3 |
| (3) | පාකිස්ථානය | (8) | වැ | (13) | අභ්‍යන්තර තැනිතලාව | (18) | 4 |
| (4) | ඩුබායි | (9) | නි | (14) | ඉන්දු නිම්න | (19) | 4 |
| (5) | මිනින්දෝරු | (10) | නි | (15) | බස්නාහිර | (20) | 3 |

## පිළිතුරු පත්‍රය II

(01) (අ) (I) A (ii) C (iii) J (iv) E
(v) H (vi) K (vii) R (viii) N (1x8)

(ආ) (i) B (ii) K (iii) D (iv) G
(v) F (vi) M (vii) J (viii) L (1x8)

(ඉ) a) ටිබෙට් සානුව b) සර්ඩේරියා / අමුඩේරියා
c) යුරේෂියාව d) 92 (1x4)

(02) (i) එවරස්ට්, කන්චන්ජුන්ගා, මකාලු, ධවලගිරි, මනස්ලු (ලකුණු 02)

(ii) නිවර්තන කලාපය, සෞම්‍ය කලාපය, ශීත කලාපය (ලකුණු 03)

(iii) සියළු දේශගුණික වර්ග පැවතීම
විශාලතම මහාද්වීපය වීම
වැඩි ජන සංඛ්‍යාවක් වාසය කිරීම
ප්‍රධාන ආගම් රැසක නිජබිම වීම
විවිධ භාෂා හා විවිධ සංස්කෘතීන් පැවතීම (ලකුණු 05)

(03) (I) භෞතික භූ ලක්ෂණ වන කඳුවැටි, හෙල්වැටි, තැනිතලා, ගංගා, මුහුදු වෙරළ හා විවිධ වෘක්ෂලතාවන් ගත හැකිය. එම භෞතික භූ දර්ශනය මත මිනිසා විසින් තම අවශ්‍යතා සඳහා ගොඩනගා ඇති මාර්ග, වැව් අමුණු, කම්හල්, වගාබිම් සියල්ල එක්ව ගත් විට එය භෞතික භූ දර්ශනය ලෙස හඳුන්වයි. (ලකුණු 02)

(ii) A - බොක්ක B - කලපුව C - දූපත (ලකුණු 03)

(iii) (a) මහනුවර, හැටන්, මහවලතැන්න, කොස්ලන්ද (ලකුණු 01)
(b) බලන, හපුතලේ, ගලගෙදර, ගිනිගත්හේන (ලකුණු 01)
( c) උන්නතාංශය, සාගරයේ සිට ඇති දුර, ඉන්දියානු උප මහද්වීපයට ආසන්නව පිහිටීම, වෙනස්වන සුළං රටා (ලකුණු 03)

(04) (i) කිසියම් ස්ථානයක කෙටි කාලයක් තුළ වායුගෝලයේ පවතින ස්වභාවය කාලගුණයයි. (ලකුණු 02)

Agaram.lk - Keep your dreams alive!
Agaram.lk - Keep your dreams alive!



agaram.lk

(ii) උෂ්ණත්වය, වර්ෂාපතනය, දේශගුණය (ලකුණු 03)

(iii) (a) සිංහරාජය, කන්නෙලිය, නාකියාදෙණිය, දෙදියගල, මොරපිටිය, බඹරබොටුව (ලකුණු 02)

(b) වියන් ස්ථරයක් පිහිටා තිබීම
තද කොළ පැහැයෙන් වර්ෂය පුරා වර්ධනය වීම
යටිරෝපණ බහුල වීම
ජෛව විවිධත්වය ඉහල යාම
ශාක පත්‍ර ඝන වීම (ලකුණු 03)

(05) (i) වලවේ ගඟ, දැදුරු ඔය (ලකුණු 02)

(ii) වියළි කලාපීය භූ දර්ශනයේ කැපී පෙනෙන ලක්ෂණය වන්නේ වැව් පද්ධතියයි.
භූමියේ බෑවුම අනුව සකස් වූ වාරි ජල පද්ධතියක් පවතී
වී වගාව ප්‍රධාන බෝග වගාවයි. ඊට අමතරව හේන් වගාව සිදු කරයි.
වැව් පදනම් කරගත් ගම්මාන බිහි වී ඇත
වී වගාවට අවශ්‍ය ජලය වාරි ජලය මඟින් සපයා ගනී
ඓතිහාසික වැදගත්කමක් ඇති නගර ඇත (අනුරාධපුරය, සීගිරිය, පොලොන්නරුව) (ලකුණු 03)

(iii) a) තේ වගාව, එළවළු වගාව, විසිතුරු මල් වගාව, සත්ව පාලනය, සංචාරක කටයුතු, හෙල්මළු ක්‍රමයට වී වගා කිරීම (ලකුණු 02)

b) 1. කඳුකර බව, කඳු මග හරිමින් ගමන් කිරීමට
2. සුළඟට ඔරොත්තු දීම සඳහා
3. භූ විෂමතාවේ විවිධත්වය, දිය ඇලි පිහිටීම, දේශගුණයේ සෞම්‍ය බව (ලකුණු 03)

(06) (i) දිස්ත්‍රික්ක අනුව මාසික කුටුම්භ ආදායම
දිස්ත්‍රික්ක අනුව ළදරු මරණ අනුපාතය
දිස්ත්‍රික්ක අනුව උපතේදී ආයු අපේක්ෂාව
ග්‍රාමීය, නාගරික, වතු අංශ අනුව සාක්ෂරතාව (ලකුණු 02)

(ii) ඒක ශීර්ෂ ආදායම
ළදරු මරණ අනුපාතය
උපතේදී ආයු අපේක්ෂාව
සාක්ෂරතාව (ලකුණු 03)

(iii) රටේ පාසල්වල පවතින පහසුකම්වල ව්‍යාප්තිය
රටේ අධ්‍යාපන මට්ටම
රටේ පවතින දියුණුව පිළිබඳ තොරතුරු දැන ගැනීම (ලකුණු 05)

(07) (i) වර්තමාන අවශ්‍යතා සපුරා ගනිමින් අනාගත පරපුරටද සිය අවශ්‍යතා ඉටුකර ගැනීමට අවස්ථාව ලැබෙන ලෙස පරිසරයක් ඉතිරි කරමින් වර්තමානයේ කරනු ලබන සංවර්ධනයයි. (ලකුණු 02)

(ii) ගංවතුර ගැලීම, නියඟය ඇතිවීම, නායයාම, ලැව්ගිනි ඇතිවීම, ගං ඉවුරු ඛාදනය (ලකුණු 03)

(iii) වන විනාශය, පහත්බිම් ගොඩකිරීම, කෘෂි රසායන භාවිතය, අවිධිමත් සංවර්ධන ව්‍යාපෘති, අධික ඉන්ධන දහනය (ලකුණු 05)

(08) (i) භූමියේ සමාන උස ඇති ස්ථාන යා කර අඳිනු ලබන රේඛා (ලකුණු 02)

(ii) උස්බිම්, තැනිතලා ප්‍රදේශ, ගංගා, දූපත්, කළපු, තුඩු (ලකුණු 03)

(iii) (a) මායිම් වර්ග, මාර්ග වර්ග, වගාවන්, ගොඩනැගිලි වර්ග
(අදාළ පිළිතුරුවලට ලකුණු දෙන්න.) (ලකුණු 02)

(b) 1. කොළපාට 2. රතුපාට 3. රතුපාට (ලකුණු 03)

යටිරෝපණ බහුල වීම
ජෛව විවිධත්වය ඉහල යාම







Agaram.lk - Keep your dreams alive!
Agaram.lk - Keep your dreams alive!
agaram.lk